# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1991/4 - 2016 ඔක්තෝබර් මස 31 වැනි සඳුදා - 2016.10.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**1983 අංක 32 දරන සමුපකාර සමිති (සංශෝධන) පනත හා 1992 අංක 11 දරන සමුපකාර සමිති (සංශෝධන) පනත සමග කියවෙන 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත**

බලතල පැවරීම - නියෝගය

1983 අංක 32 දරන සමුපකාර සමිති (සංශෝධන) පනත හා 1992 අංක 11 දරන සමුපකාර සමිති (සංශෝධන) පනත සමග කියවෙන 1972 අංක 5 දරන සමුපකාර සමිති පනතේ 2(2) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය රිෂාද් බදියුදීන් වන මම, සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ රෙජිස්ට්‍රාර්ට සහය වීමට පත් කර ඇත්තා වූ මීට අමුණා ඇති උපලේඛනයේ I තීරුවේ සඳහන් අය වෙත, 1983 අංක 32 දරන සමුපකාර සමිති (සංශෝධන) පනත හා 1992 අංක 11 දරන සමුපකාර සමිති (සංශෝධන) පනත සමග කියවෙන 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත හා ඒ යටතේ පනවා ඇති රීති මාලාව යටතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ රෙජිස්ට්‍රාර් වෙත පැවරී ඇත්තා වූ එකී උපලේඛනයේ III වැනි තීරුවේ සඳහන් සියලුම බලතල එකී උපලේඛනයේ II වැනි තීරුවේ සඳහන් දින සිට මෙයින් පවරමි.

රිෂාද් බදියුදීන්,
කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය.

2016 සැප්තැම්බර් මස 07 වන දින,
කොළඹ දී ය.

*උපලේඛනය*

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| නාවලගේ වසන්තිකා ඩයස් | 2016.07.26 | 1983 අංක 32 දරන සමුපකාර සමිති (සංශෝධන) පනත හා 1992 අංක 11 දරන සමුපකාර සමිති (සංශෝධන) පනත සමග කියවෙන 1972 අංක 5 දරන සමුපකාර සමිති පනතේ 3, 5, 6, 7, 8, 9, 33, 43(අ), 43(ආ), 44, (44,(6) හැර), 45, 46, 48, 49, 50, 52, 53, 54, (54(2) හැර), 58, (58(2)(අ) හැර), 59, 60(අ), 66(අ), 68 හා 72 යන වගන්ති යටතේ රෙජිස්ට්‍රාර්ගේ සියලුම බලතල<br><br>සමුපකාර රීතින්හි 4, 11, 15, 16(ii), 18, 19, 27, 33, 35, 37, 40, 41, 42, 43, 48, 49, (49(xii) හැර) 52, හා 53 දරන රීති යටතේ රෙජිස්ට්‍රාර්ගේ සියලුම බලතල |

11 - 689


1A - G 24462 — 08 (2016/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*